**කතරගම ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 වැනි දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**
**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
**-------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් කැබැලි 21 ක වටිනාකම පිළිගත් වෘත්තීය තක්සේරුකරුවකු ලවා තක්සේරු කර ගිණුම් ගතකිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කඩා ඉවත් කරන ලද රු. 621,595 ක් වටිනා පැරණි සභා ගොඩනැගිල්ලේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) සභාව සතු කතරගම බස් නැවතුම්පල ගොඩනැගිලි වටිනාකම පිළිගත් වෘත්තීය තක්සේරුකරුවකු ලවා තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 2,667,793 ක් වුවද, එය රු. 1,500,000 ක් ලෙස රු. 1,167,793 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රථගාල් ආදායම් රු. 245,120 ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**--------------------------**

ගිණුම් විෂයයන් 7 කට අදාලව මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 11,161,377 ක් වූ අතර ලේඛන හා උපලේඛන අනුව ශේෂය රු. 4,015,208 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

**------------------**

2013 වර්ෂයේ සිට මුල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති රු. 16,971 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කුමන පාර්ශවයන්ගෙන් අයවිය යුතුද යන්න හඳුනා නොගත් වෙළඳ ස්ථාන කුලී රු. 6,349,592 ක් අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු 2009 -2013 කාලයට අදාල එකතු කළ අගය මත බදු රු. 4,319,539 ක් සහ 2009-2015 කාලයට අදාල මුද්දර බදු රු. 330,176 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.414,605 ක හිඟ විශ්‍රාම වැටුප් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**--------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 131,896,864 ක වත්කම් විෂයන් 5 ක් සහ එකතුව රු. 14,005,744 ක වගකීම් විෂයයන් 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිවිය.

**1.3.6 නීති,රීති,රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මු.රෙ. 71 | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව ප්‍රකාරව අනියම් පදනම මත සේවය කළ මුරකරුවන් 2 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයට පිටින් ස්ථිර සේවයට පත් කර තිබුණි. |
| (ii) මු.රෙ. 103 හා 104 | සභාව සතු අංක WPZA -5063 දරන බැකෝලෝඩර් රථය සහ PD 1846-දරන කැබ් රථය පිළිවෙලින් 2015 ජුලි 29 දින හා 2013දෙසැම්බර් 5 දින අනතුරකට ලක්වී තිබු නමුත් ඊට අදාල ප්‍රාරම්භක හා අවසාන වාර්තා සකස් කර නොතිබුණි. |
| **(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| (i) 49 වගන්තිය | සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව සභා බල ප්‍රදේශයේ දුරකථන සමාගම් 2ක් විසින් කුළුණු 5ක් ස්ථාපිත කර තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,431,284 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,197,295 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,233,989 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 වරිපනම් බදු

-------------

(අ) රු. 10,000 ට වැඩි හිඟ වරිපනම් බදු ඒකක 132 න් රු. 3,826,275 ක මුදලක් අයවිය යුතු වුවත් 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 155, 156, 158, 159, 162 හා 163 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ නිලධාරීන් සහ සේවකයින් 13 දෙනෙකු ආදායම් රැස් කිරීම් සඳහා යොදවා තිබුණද හිඟ වරිපනම් බදු අය කර ගැනිමේ ප්‍රතිශතය සියයට 23 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ වරිපනම් රැස් කිරිමේ ප්‍රතිශතය සියයට 48 ක් වැනි අඩු ප්‍රතිශතයක් විය.

### 2.2.2 කඩ කුලි

-----------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදි රජයේ තක්සේරුකරුවකු ලවා කඩ කාමර කුලි තක්සේරු කර තිබු මුත් එම නව තක්සේරු කුලි ක්‍රියාත්මක කිරිමට කටයුතු නොකිරිම නිසා රු. 321,350 ක ආදායමක් සභාවට අහිමි වී ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු කඩ කාමර වලින් අයවිය යුතු හිඟ කුලිය රු. 6,351,392 ක් විය.

(ඇ) සභාව සතු කඩ කාමර 74 ක් බදු දී තිබු නමුත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 4,921,145 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබු අතර සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය හඳුනාගෙන නොතිබුණි.

### 2.2.4 වෙනත් ආදායම්

-----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ඇසල උත්සවයේ අනුග්‍රාහක ආයතන 12 කට වෙළඳ කුටි 18 ක් ලබාදී තිබු අතර පාරිභෝගිකයින්ගෙන් කිසිදු ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රජ ගාල් ආදායම් රැස් කිරීම සඳහා කොමිස් පදනම මත බඳවා ගත් සේවකයින් 4 දෙනෙකු සහ ස්ථිර සහ ආදේශක සේවකයින් 02 දෙදෙනකුට ලබා දී තිබූ ලදුපත් වලින් අයවිය යුතු රු. 245,120 ක් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති සම්ප්‍රේෂණ කුළුණු 6න් 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 අධිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.104,017 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2(1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන, වීථි පහන් ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරිම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු.96,600 ක වියදමක් දරා තිබුණි.

## 3.2 හඳුනාගත් අලාභ

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 23 දින බුත්තල ප්‍රාදේශීය සභාව විසින් සභාවට නිකුත් කර තිබූ ජී.අයි .බට 88 න් 21 ක් අස්ථානගතවී තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 5 දින වීරවිලදී අනතුරකට පත් අංක PD - 1846 දරන සභාව සතු කැබ් රථය අළුත්වැඩියා කිරිම සඳහා මාතර දක්වා ප්‍රවාහනයට රු. 25,000 ක් ගෙවා තිබුණද එම මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් හෝ රක්ෂණයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

ප්‍රාදේශීය සභාව විසින් 2005 වර්ෂයේදි රු. 431,541 ක වියදමක් දරා ගලපිටගල යාය ප්‍රදේශයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර 2016 මැයි 30 දින වන විටත් අදාල ගොඩනැගිල්ල අදාල කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 19(1) (1) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව 1995 සිට 2014 දක්වා අනියම් හා

ආදේශක පදනම මත කම්කරුවන් 22 දෙනෙකු බඳවා ගෙන දළ වැටුප්, සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායක ලෙස රු. 21,694,084 ක් ගෙවා තිබුණි.

(ආ) තනතුරු 5 කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 34 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදීද යොදවාගෙන වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඇ) කම්කරු තනතුරක් සඳහා ස්වේච්ඡා පදනම මත පත්වීමක් 2014 මාර්තු 01 දින සිට ලබා දී තිබුණද 2014 මාර්තු සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැටුප් සේවක අර්ථ සාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායක ලෙස රු. 422,917 ක් ගෙවා තිබුණි.

(ඈ) සභාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නොතිබියදි පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියක් නොමැතිව ස්වේච්ඡා පදනම මත බඳවා ගත් සේවකයින් 4 දෙනෙකුට 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 336,200 ක දිමනාවක් ගෙවා තිබුණි. මෙම පුද්ගලයින් බඳවා ගැනිමේ පදනමද විගණනයට අනාවරණය නොවීය.

(ඉ) ප්‍රාදේශීය සභාවේ ගිනිබට සේවාව සඳහා සේවකයින් 08 දෙනෙකු යොදවා තිබුණද, ගිනිබට සේවාව සඳහා අවශ්‍ය රථය 2015 ජුලි 29 දින සිට අක්‍රියව තිබුණි. ගිනිබට සේවාවට අදාල සේවකයින් වෙනත් ගිනි නිවන ඒකක පවතින ආයතනවලට අනුයුක්ත කිරිමට කටයුතු කර නොතිබුණි.

**3.5 වතක්ම කළමනාකරණය**

**-------------------------**

**නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 මැයි 07 දින හා 2015 ජුලි 06 දින ලැබුණු පෝටෝන් බැකෝ ලෝඩරය හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කිසිදු කාර්යයක් සඳහා භාවිතයට ගෙන නොතිබු අතර ස්වාභාවික ආපදාවන්ට ලක්වෙමින් කාර්යාල භූමියේ ගාල් කර තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ නැණසලක් ආරම්භ කිරිම සඳහා 2014 නොවැම්බර් 18 දින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මඟින් පරිගණක 4ක් සහ ඊට අදාල උපාංග ලබාදී තිබුණද නැණසල ආරම්භ කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස රු. 176,700 ක් ගෙවා වැටුප් සැකසීමේ කටයුතු සඳහා මිලදි ගත් පරිගණකය සහ මුද්‍රණ යන්ත්‍රය භාවිතයට ගැනිමට කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

සෑම රාජ්‍ය ආයතනයකම සිය දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමේ කාර්යයේදී එකී ආයතනයනට අදාල පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන ඒවා ඉටුකිරීම සඳහා උපක්‍රම අනුගමනය කළ යුතු වුවත්, සභාව විසින් ඔවුන්ගේ පාරිසරික හා සමාජ වගකීම හඳුනාගැනීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.5 විගණන හා කළමනාකරණ කමිටු**

2009 ජූනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වාහන උපයෝජනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ගබඩා පාලනය